ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Sri Jayawardanapuara Education Zone
දෙවන වාර විභාගය- 2026
Second Term Test Examination - 2026

ශ්‍රේණිය: 10 ශ්‍රේණිය | විෂයය: ඉතිහාසය | පත්‍රය : 1 | කාලය; පැය: 1 යි.

නම: / Name ..........................................................
විභාග අංකය : / Index Number ........................................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. මෙම පත්‍රය සඳහා 80ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,

1). මහාවංශය යි. 2). දීපවංශය යි. 3). චූලවංශය යි. 4). බෝධි වංශය යි.

2) මහාවංශයේ ඇතැම් තැන් විස්තර කොට අර්ථ විවරණය සඳහා සම්පාදනය කළ මහාවංශටීකාව හඳුන්වා ඇත්තේ කර නමකින්ද?

1). සිහලට්ඨකතා වංශය යනුවෙනි. 2). විනයට්ඨකතාවංශය යනුවෙනි.
3). වංසත්තප්පකාසිනී යනුවෙනි. 4). නිකාය සංග්‍රහය යනුවෙනි.

3) බෞද්ධ රාජධානි පිළිබඳ විස්තර දැක්වෙන දේශාටන වාර්තාව අයත්වන මූලාශ්‍රය කුමක්ද?

1). චීන මූලාශ්‍රය. 2). අරාබි මූලාශ්‍රය. 3). පෘතුග්‍රීසි මූලාශ්‍රය. 4). ඕලන්ද මූලාශ්‍රය.

4) සිත්නාරුබිම බුදල්නාට කළගුණ සැලකීම පිණිස පනාකඩුව තඹ සන්නස කර වූ රජු වන්නේ,

1). මහා පරාකුමබාහු රජතුමා 2). නිශ්ශංකමල්ල රජතුමා
3). පණ්ඩුකාභය රජතුමා 4). පළමුවන විජයබාහු රජතුමා

5) පුරා විද්‍යාඥයින්ගේ පිළිගැනීම අනුව ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් වූයේ,

1) වසර විසි අට දහසකට පෙරය. 2). එක්ලක්ෂ විසිපන්දහසකට පෙරය.
3). වසර තිස් අට දහසකට පෙරය. 4). දෙලක්ෂ විසිපන්දහසකට පෙරය.

6) ලංකාවෙන් හමු වී ඇති පැරණිතම කාසිය හඳුන් වන්නේ,

1). අක කාසි යනුවෙනි. 2). කහාපණ කාසිය යනුවෙනි.
3). ලක්ෂ්මී කාසිය යනුවෙනි. 4). අලියා සහ ස්වස්තික කාසිය යනුවෙනි.

7) වසභ රජු පත් කරන ලද සෘෂිගිරි නම් ඇමතිවරයා යාපනය ප්‍රදේශය පාලනය කළ බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ,

1). පනාකඩුව තඹ සන්නස 2). ගල්පොත සෙල්ලිපිය.
3). සංගමුව විහාර ලිපිය. 4). වල්ලිපුරම් රන් සන්නස.

SLGURU.LK

8) ඇටසැකිලි නවා වකුටු කර වළලා තිබීම පිළිබඳ සාක්ෂි හමුවන ස්ථානය වන්නේ,

1). කිතුල්ගල බෙලිලෙන. 2). බුලත්සිංහල පාහියන් ලෙන.

3). කුරුවිට බටදොඹලෙන 4). අත්තනගොඩ අලුලෙන

9) තමන්ගේ දසවෙනි රාජ වර් ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කල බව සඳහන් රජු වන්නේ,

1). දුටුගැමුණු රජතුමා. 2). දේවානම් පියතිස්ස රජතුමා.

3). පණ්ඩුකාභය රජතුමා. 4). පළමු වන විජයබාහු රජතුමා.

10) ක්‍රිස්තුව ෂ නව වන සියවසට අයත් සෙල්ලිපිවල "සභාව " යන පදයෙන් අදහස් කර තිබෙනුයේ,

1). රාජ සභාවයි. 2). ගම් සභාවයි.

3). එවක පැවති අධිකරණය යි. 4). විධායකය යි.

11) ගංවතුර පාලනය කිරීම සඳහා කිරිදි ඔය හරස් කර අමුණක් බඳින ලද රජතුමා වන්නේ,

1). ඉලනාග රජුය. 2). අභයනාග රජුය.

3). කාවන්තිස්ස රජුය. 4). දුටුගැමුණු රජුය.

12) ශ්‍රී මහා බෝධි රෝපණ අවස්ථාවේ චන්දනගාම සහ කතරගම ක්ෂත්‍රියන්ට ආරාධනා කල රජතුමා වන්නේ,

1). දුටුගැමුණු රජතුමා. 2). පණ්ඩුකාභය රජතුමා.

3). මුටසීව රජතුමා. 4). දේවානම් පියතිස්ස රජතුමා.

13) පහත "අ" තීරුවේ ඇති ග්‍රන්ථ කතුවරුන් හා "ආ" තීරුවේ සඳහන් ග්‍රන්ථ ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. හියුං සියැං | A. නැචුරාලිස් හිස්ටෝරියා |
| 2. ප්ලිනි | B. භූගෝල විද්‍යා ශාස්ත්‍ර ප්‍රවේශය |
| 3. ඇරිස්ටෝටල් | C. දේශාටන වාර් තා කෘතිය |
| 4. ටොලමි | D. ඩිමුන්ඩෝ කෘතිය |
| | E. ඉන්ඩිකා කෘතිය |

1). CADB 2). BADE 3). ABEC 4). CABE

14) කිසිදු සතෙකු නොමැරිය යුතු බව සඳහන් කරමින් මුළු වරට "මාඝාත නීතිය " නමින් නීතියක් පනවන ලද රජු වන්නේ,

1) නිශ්ශංකමල්ල රජු ය. 2) ආමණ්ඩගාමිණි රජු ය.

3) හතරවන උදය රජු ය. 4) කූටකණ්ණතිස්ස රජු ය.

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

15) ශ්‍රී ලාංකික තානාපතිවරයෙකු රෝමයට ගොස් වීදුරු පබලු රැගෙන ආ බවට මූලාශ්‍ර වල සඳහන් වන්නේ, කිනම් රජ සමයේ දීද?

1) දේවානම් පියතිස්ස රජ සමයේ. 2) භාතිකාභය රජ සමයේ.

3) දුටුගැමුණු රජ සමයේ. 4) පළමු වන විජයබාහු රජ සමයේ.

16) වැව් ප්‍රපතනය ලෙස හඳුන්වන්නේ,

1) සෑම ගමකටම වෙන්ව පවතින වැවක් සෑදීම

2) කුඩා වැව් කිහිපයක් එක්කොට විශාල වැවක් ඉදි කිරීම.

3) තනි වැවක් වෙනුවට සමීපව තිබෙන වැව් කිහිපයක් ඇළ මාර්ග තුළින් සම්බන්ධ කොට වැව් පද්ධතියක් නිර්මාණය කිරීම.

4) වැවට රොන්මඩ එකතු වීම වැළැක්වීමට වැවට ඉහළින් බැම බැඳීම.

17) වීන, ගුංජා, මාසක, අක ආදී මිනුම් භාවිතා කරනු ලැබුවේ,

1) දිග මැනීමට 2) බර මැනීමට 3) අවකාශය මැනීමට 4) කාලය මැනීමට

18) දසගම ඇත්තන් ගැටලු විසඳීමේ කටයුතු වල නිරත වූ බව සඳහන් මූලාශ්‍රය වන්නේ?

1) කණ්ඩලමේ කොත්ගල්කන්ද ලිපිය. 2) දඹුල්ලේ කලුදිය පොකුණ ලිපිය.

3) අනුරාධපුර බුද්ධන්නේගල ලිපිය. 4) වෙගිරිය දේවාලයේ සෙල්ලිපිය.

19) "**මඩු,පාවිකා**" යන විශේෂ ගෞරව නාමයෙන් කාන්තාවන් හැඳින් වූ බව දම්පියා අටුවා ගැටපදයෙන් සඳහන් වේ. එසේ හඳුන්වනු ලැබුවේ,

1) සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන්. 2) නර්තනයෙහි දක්ෂ කාන්තාවන්.

3) රාජ්‍ය පාලනයෙහි දක්ෂ කාන්තාවන්. 4) ගී ගායනයෙහි දක්ෂ කාන්තාවන්.

20) "**කාල සුමන**" නම් වෙළඳ පොළක් පැවති බවට තොරතුරු හමුවන නගරය වන්නේ,

1) අනුරාධපුරය 2) පොළොන්නරුව 3) මාගම 4) කුරුණෑගල

21) මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස් කර ඉදිකළ ඇළහැර ඇළ මඟින් ජලය ගෙන ගිය වැව් වන්නේ,

1) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව, හුරුලු වැව

2) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව, කන්තලේ වැව

3) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, තිසා වැව

4) මින්නේරිය වැව, කන්තලේ වැව, ගිරිතලේ වැව, පදවිය වැව


For Educational Purpose Only

SLGURU.LK

22) විශාල ප්‍රමාණයේ මැටි බඳුන් ළිඳ තුලට බස්සවා සකස් කරන ලද ඌරා කැට ළිං වලින් බලාපොරොත්තු වූයේ,

1) භික්ෂූන් වහන්සේලාගේ පරිහරණයට ජලය සැපයීමයි.

2) පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමයි.

3) පොළව අභ්‍යන්තරයේ ඇති ජලය පහසුවෙන් ලබා ගැනීමයි.

4) ස්නානය සඳහා පොදු ළිං ඇති කිරීමයි.

23) පංච කකුධ භාණ්ඩ යනු මොනවාද?

1) වල් විදුනාව, මිරිවැඩ සගල, මඟුල් කඩුව, හෙල්ල, නළල් පටය.

2) වල් විදුනාව, සේසත, මිරිවැඩි සගල, නළල් පටය, දුන්න.

3) වල් විදුනාව, මිරිවැඩි සගල, නළල් පටය, ඔටුන්න, දුන්න,

4) වල් විදුනාව, මිරිවැඩි සගල, මඟුල් කඩුව, සේසත, නළල් පටය.

24) දරුණු උණ රෝගයක් වැළඳුණු රෝගීන් හට ප්‍රතිකාර කිරීම සඳහා iv කාශ්‍යප රජු විසින් ඉදි කරන ලද රෝහල් විශේෂය හඳුන්වන ලද්දේ,

1) සොත්ථි සාලා  2) වෙජ්ජ සාලා  3) පසවන්ති නාම සාලා  4) උපසග්ගරෝග නාස

25) දඹුලු විහාරයේ පර්වතයක සෙල්ලිපියක් පිහිටුවා තමන් "නරඉසෙර " යනුවෙන් හඳුන්වා ගත් රජතුමා වන්නේ,

1) කූට කණ්ණ අභය රජතුමා.  2) වට්ටගාමිණී අභය රජතුමා.

3) වංකනාසික තිස්ස රජතුමා.  4) නිශ්ශංකමල්ල රජතුමා.

26) පැරණි රාජ්‍ය නිලධාරීන් හා ඔවුන්ගේ කාර් යයන් "අ" සහ "ආ" තීරු දෙකෙහි දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. කොතුරු ගැනා. | A. කාසි අච්චු ගැසීමේ ප්‍රධානී |
| 2. රූප අදෙක | B. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී |
| 3. පන අදෙක | C. චත් සිරිත් හා චාරිත්‍ර පිළිබඳ ප්‍රධානී |
| 4. කන පෙඩික | D. භෝජනාගාර ප්‍රධානී |
| | E. වෙළඳ කටයුතු භාර ප්‍රධානී |

1). CAEB  2). CEAD  3). CABD  4). CDBA

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

27) ක්‍රි.ව 12 සියවස වන විට ශ්‍රී ලංකාවේ ප්‍රභූන් අතර ජනප්‍රියව පැවති ආහාරයක් වූයේ සුවඳ ගිතෙලින් පිසූ මොණර මස් සහ ඇල් සහලින් සැදූ බත් බව සඳහන් මූලාශ්‍රය කුමක්ද?

1) සද්ධර් මරත්නාකරය 2). සද්ධර් මලංකාරය 3). සද්ධර්ම රත්නාවලිය 4) දම්පියා අටුවා ගැටපදය

28) "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් සඳහන් වනුයේ,

1) කොණ්ඩ වට්ටවාන් ලිපියේ.
2) බුද්ධන්නේ හෙල ලිපියේ.
3) පෙරිය පුලියන්කුලම ලිපියේ.
4) සිතුල්පව්ව ලිපියේ.

29). සැත්කම් සඳහා භාවිතා කරන ලද ඉතා පැරණි ලෝහමය කතුරු කිහිපයක් සොයා ගන්නා ලද්දේ,

1) ජේතවන විහාර කැණීම් වලින්.
2) අභයගිරි කැණීම් වලින්
3) ආලාහන පිරිවෙන් කැණීම් වලින්
4) දැදිගම කොට වෙහෙර කැනීම් වලින්.

30). ගමක සැඟ වී සිටින අපරාධකරුවන් අල්ලා දෙනතුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු බද්ද හැඳින්වූයේ,

1). කැති අඩ බද්ද 2) ගෘහ දණ්ඩ බද්ද 3) කෙවූ කනබ බද්ද 4) දකපති බද්ද

31) සකපෝරුව නම් සරල යන්ත්‍රය ආධාර කරගෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන ලද අමුද්‍රව්‍ය වූයේ,

1) යකඩ 2) මැටි 3) රන්. 4) නූල්

32) පියාගෙන් පුතාට රජකම උරුම් වන අවස්ථාවක් නොවන පිළිතුර තෝරන්න.

1). දේවානම් පියතිස්ස රජුගෙන් පසුව සූරතිස්ස රජුට.
2) කාවන්තිස්ස රජුගෙන් පසුව දුටුගැමුණු රජුට.
3) වසභ රජුගෙන් පසුව වංකනාසිකතිස්ස රජුට.
4) පණ්ඩුකාභය රජුගෙන් පසුව මුටසීව රජුට,

33).

- ප්‍රථම සංවිධානාත්'ත්මක සටන් ව්‍යාපාරයකට නායකත්වය දීම.
- ලංකාව පළමු වරට එක්සේසත් කිරීම.
- රෝහල් 18ක් ඉදි කිරීම.
- විමධ්‍යගතව පැවති දේශපාලන බලය වඩාත් ශක්තිමත් පදනමකින් යලි සංවිධානය කිරීම.

ඉහත තොරතුරු හා සම්බන්ධ රජු වන්නේ,

1) පණ්ඩුකාභය රජතුමා. 2) දේවානම් පියතිස්ස රජතුමා 3) වසභ රජතුමා 4) දුටුගැමුණු රජතුමා.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

34). තෙවරක් මෙරට පාලනය කරන ලදැයි සඳහන් රැජිණ වන්නේ,

1) සුගලා බිසව 2) කළ්‍යාණවතී බිසව 3) ලීලාවතී බිසව 4) අනුලා බිසව

35) ලංකාවේ පළමුවන නාගරීකරණය පිළිබිඹු වන නගර ලෙස නම් කළ හැකි නගර දෙක වන්නේ,

1) අනුරාධපුරය හා මාගම 2) අනුරාධපුරය හා දඹදෙණිය.

3). අනුරාධපුරය හා ගම්පොළ 4) අනුරාධපුරය හා කුරුණෑගල

36). සමනළ කන්ද " ආදම්ගේ කන්ද" ලෙසින් හඳුන්වනු ලැබුවේ,

1). බෞද්ධ බැතිමතුන්. 2). හින්දු බැතිමතුන්.

3). ඉස්ලාම් බැතිමතුන්. 4) ක්‍රිස්තියානි බැතිමතුන්.

37) පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගීවීම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට ගිය මෙරට කීර්තිමත් පාලකයෙකු වූයේ,

1). භාතිකාභය රජු. 2). පළමු වන ගජබාහු රජු

3). පළමුවන අග්බෝ රජු. 4) පළමු වන උපතිස්ස රජු.

38) පෘතුග්‍රීසි ජාතිකයින් මෙරටට පැමිණි පසු නිම කළ නිර් මාණයක් සේ සැළකෙන නෙස්ටෝරියානු කුරුසය සටහන් කරන ලද ගල් පුවරුව සොයා ගනු ලැබුවේ,

1) පොළොන්නරුවෙනි. 2) අනුරාධපුරයෙනි.

3) කුරුණෑගලිනි. 4) යාපනයෙනි.

39) අනුරාධපුර යුගයට පමණක් අයත් රජවරු වන්නේ,

1) පණ්ඩුකාභය, දුටුගැමුණු, කාශ්‍යප, වසභ

2) පණ්ඩුකාභය, දේවානම් පියතිස්ස, පරාක්‍රම පාණ්ඩ්‍ය, දුටුගැමුණු

3) පණ්ඩුකාභය, මහසෙන්, සහස්සමල්ල, කාශ්‍යප

4) පණ්ඩුකාභය, පළමුවන අග්බෝ, දේවානම් පියතිස්ස, නිශ්ශංකමල්ල රජු.

40) අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා වන්නේ,

1). හතරවන කාශ්‍යප රජු. 2) පස්වන මිහිඳු රජු.

3) හතරවන මිහිඳු රජු. 4) දෙවන අග්බෝ රජු.

SLGURU.LK



For Educational Purpose Only

“Reading is a basic tool in the living of a good life.” — Joseph Addison

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
SLGURU.LK

**Sri Jayawardanapuara Education Zone**

දෙවන වාර විභාගය- **2026**

**Second Term Test Examination - 2026**

ශ්‍රේණිය: 10 ශ්‍රේණිය විෂයය: ඉතිහාසය පත්‍රය : 11 කාලය; පැය: 2 යි.

නම: Name ..............................................................  විභාග අංකය : Index Number ..........................................

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර් ය වේ.
- II කොටසේ ප්‍රශ්න හතරකට ද, III කොටසින් එක ප්‍රශ්නයකට ද පිළිතුරු ලියන්න.
- පිළිතුරු සැපයිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

**I කොටස**

01) අ. (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලැගුණු කර නම් කරන්න.

මා තොට, මල්වතු ඔය, පොළොන්නරුව, මිනිහාගල් කන්ද, ත්‍රිකුණාමලය, මහනුවර, ඉරණමඩු ජලාශය, ගාල්ල, යෝධ වැව, සීගිරිය, කෝට්ටේ, දඹකොළ පටුන (ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.

පෘතුගාලය, රතු මුහුද, ජපන් දූපත්, මලය අර්ධද්වීපය, ජාවා දූපත, අරාබිය (ලකුණු 6)

ආ. (i). පහත A,B,C,D යටතේ අසා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A. පනාකඩුව තඹ සන්නස කර වූ රජ කුමා කවුද?

B. මහාවංශයේ පළමු කොටස රචනා කළ හිමියන් නම් කරන්න.

C. ඉසිගිරි නම් ඇමතිවරයෙකු යාපනය ප්‍රදේශය පාලනය කරනු ලැබුවේ කිනම් රජ සමයේදී ද?

D. මෙරට භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමට මූලික වූ බිසව කව්රුද? (ලකුණු 4)

- A හා B පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(A) 1. පින්තූරයෙන් දැක්වෙන නිර් මාණය හඳුන්වන්න.

2. මේවා යොදාගෙන ඇත්තේ කුමන කාර්යයක් සඳහාද?

3. මෙය සොයා ගනු ලැබූ ප්‍රදේශය නම් කරන්න.

4. එය කිනම් යුගයකට අයත්වේ ද? (ල. 4)



(B) 1. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2. එය හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයෙන්ද?

3. ඒ හා සම්බන්ධ රජතුමා කවුද?

4. මේ තුළින් හෙළිවන භෞතික විද්‍යා මුලධර්මය කුමක්ද? (ල. 4)

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

**II කොටස**

(2) i ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් දකුණු ඉන්දීය මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ල.3)

ii. දීපවංශය හා මහාවංශය අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න. (ල.1)

iii. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.5)

iv. පුරාවිද්‍යා මූලාශ්‍ර විනාශ විය හැකි ආකාර තුනක් විස්තර කරන්න. (ල.6)

(3) i. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානව අවශේෂ හමු වූ ස්ථාන තුනක් ලියන්න. (ල.3)

ii. පූර්ව ඓතිහාසික යුගයට අයත් මූලික ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.4)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.5)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය හා ව්‍යුහය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

(4) i. රාජ්‍යත්ව සංකල්ප තුනක් නම් කරන්න. (ල.3)

ii. රාජ්‍ය උරුමය හිමි වූ ආකාර දෙකක් නම් කරන්න. (ල.4)

iii. රජුගෙන් රට වැසියාට ඉටු විය යුතු යුතුකම් දෙකක් පැහැදිලි කරන්න. (ල.5)

iv. දුටුගැමුණු රජුගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

(5) i. පැරණි සමාජයේ සත්ව පාලනය යටතේ නිවෙස් වල ඇති කළ සතුන් තිදෙනෙක් නම් කරන්න. (ල.3)

ii. හෙන් වගා කිරීම වෙනුවෙන් අය කළ බදු වර්ග දෙක නම් කරන්න. (ල.4)

iii. අතීතයේ පුරාණ වෙළඳ පොළවල් සංවිධානාත්මක ලෙස පාලනය වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.5)

iv. අතීතයේ මෙරට රජවරු දියුණු විදේශ සබඳතා පවත්වා ඇති ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

(6) i. පහත වැව් නිර් මාණය කරන ලද රජවරු නම් කරන්න.

A. මින්නේරිය වැව B. කලා වැව C. තිස්සමහාරාම වැව (ල.3)

ii. වැවක කොටස් හතරක් නම් කරන්න. (ල.4)

iii. අතීතයේ මෙරට දියුණු සෞඛ්‍ය සේවාවක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.5)

iv. රුවන්වැලි මහා සෑයේ අත්තිවාරම සකස් කළ ආකාරය පිළිවෙලින් විස්තර කරන්න. (ල.6)

(7) i. බෞද්ධ විහාරාම වල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද පොකුණු තුනක් නම් කරන්න. (ල.3)

ii. පුරාණ යකඩ නිස්සාරණ සිදුකළ බවට තොරතුරු හමුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ල.4)

iii. පැරණි නගර පරිහානියට පත්වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න (ල.5)

iv. පොලොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් විස්තර කරන්න. (ල.6)

SLGURU.LK



For Educational Purpose Only